## ලෝක පරිසර දිනය

# ගසක් සිටවා රටක් ගොඩනගමු

**ජූනි 05 වැනිදට යෙදෙන ලෝක පරිසර දිනය වෙනුවෙන් මේ ලිපිය පළ වේ.**

චන්ද්‍රභානු සමරවීර

“වනාන්තරය වූ කලී ස්වකීය පැවැත්ම සඳහා ඉල්ලීම් නොකරන්නාවූද, ජීව ක්‍රියාවලියේදී සිය නිෂ්පාදකයන් පරිත්‍යාගශීලි ලෙස ප්‍රදානය කරන්නාවූද, අසීමිත දයානුකම්පාවකින් හා පරිත්‍යාගශීලි භාවයෙන් යුතු අපූරු ජීවිතයකි. සකල ජීවීන්හට රක්ෂාවරණය සලසන්නාවූ එය පොරෝ පහරින් විනාශය සළසන්නා හට පවා සේවය ගෙන දෙයි.” බුදුරජාණන් වහන්සේ එක්තරා සූත්‍රයකදී මෙසේ දේශනා කොට ඇත්තේ ජාතිය වෙනුවෙන් ගස් සිටුවීමේ සහ එය රැක ගැනීමේ උදාර කාර්‍යභාරය සකල ලෝකවාසී ජනතාවට කියා දෙමිනි.

වන සම්පතින් සිදුවන සේවය සත්වෙනි ලෝක වන විද්‍යා සමුළුවේ ප්‍රකාශනයක ලුහුඬින් මෙසේ සඳහන් වේ.

“වනාන්තර පස සෝදාපාළුව වළක්වයි. කෘෂිකර්මය ආරක්ෂා කරයි. ගංවතුර ගැලීම අඩුකරයි. පිරිසිදු ජලය ලබාගැනීම පහසු කරයි. ප්‍රසන්නතාවත්, විනෝදයත් සපයා දෙයි. වන ජීවිතයට රැකවරණ සලසයි. දූෂණවීම අඩුකරයි. පාරිසරික පරිහානියට එරෙහිව රැකවරණ සලසයි. දැව සපයා දෙයි. දැව උපයෝගී කොට ගන්නා කාර්මික නිෂ්පාදන හා මිනිසාගේ සෑම කාර්යය ක්ෂේත්‍රයකම යටතට එන වන නිෂ්පාදනය රැකියා සපයා දෙයි. කොටින් කියතොත් වනාන්තරවලින් පාරිසරික, සාමාජීය හා ආර්ථික ප්‍රගතියට නිශ්චිත වශයෙන්ම උපකාරයක් සැලසේ.”

ක්‍රි. ව. 2005 වන විට මිනිසුන් 50,000 දෙනෙකු ප්‍රශ්වාස කරනු ලබන කාබන්ඩයොක්සයිඩ් වායු



## කොස් වගාව ව්‍යාප්ත කිරීමේ හා කොස් ආහාර නිෂ්පාදන ජනප්‍රිය කිරීමේ ව්‍යාපෘතිය



කොස් වගාව ව්‍යාප්ත කිරීමේ හා කොස් ආශ්‍රිත ආහාර නිෂ්පාදන ජනප්‍රිය කරවීමේ නව ව්‍යාපෘතියක් ලේක්හවුස් ආයතනය ක්‍රියාත්මක කර ඇත.

රාජ්‍ය හා රාජ්‍ය නොව සංවිධානවල සහාය ඇතිව ක්‍රියාත්මක කරන මෙම ව්‍යාපෘතිය මගින් රට තුළ දුක්ගිනි නැති නිරෝගී පරපුරක් ඇති කිරීම සහ ඉදිරියේ දී ආහාර හිඟයක් ඇතිවුවහොත් ඊට මුහුණ දීම ඇතුළු අරමුණු කිහිපයක් ඉටුකර ගැනීමට අපේක්ෂා කෙරේ.

රට පුරා ජාතික මට්ටමින් ක්‍රියාත්මක කිරීමට යෝජිත මෙම නව ව්‍යාපෘතිය මගින් කොස් පැළ ලක්ෂයක් සිටුවීමට කටයුතු යොදා ඇත.

'කොස් මාමා' හෙවත් ආතර් වී දියෙස් මහතා අනුස්මරණය කරමින් එතුමා කොස් පැළ සිටුවීමේ ව්‍යාපාරය ආරම්භ කළ ජූනි 11 වැනිද මෙම කොස් පැළ ලක්ෂය සිටුවීමේ වැඩසටහන ආරම්භ කරන බවත්, ඒ සඳහා ලේක්හවුස් ආයතනයට රාජ්‍ය සහ රාජ්‍ය නොවන සංවිධානවල සහය අපේක්ෂා කරන බවත්, කොස් වලින් ලැබෙන පෝෂ්‍යදායී ගුණය හා ඖෂධීය ගුණය පිළිබඳව ජනතාවට දැනුමක් ලබාදීම සඳහා ලේක්හවුස් ආයතනය මගින් කටයුතු කරන බවත්, ලේක්හවුස් ආයතනයේ කර්තෘ මණ්ඩල අධ්‍යක්ෂ බන්දුල පද්මකුමාර මහතා එම සාකච්ඡාවේ දී පැවසී ය.

මෙම ව්‍යාපෘතියේ සභාපති ලෙස කර්තෘ මණ්ඩල අධ්‍යක්ෂ බන්දුල පද්මකුමාර (දුරකථනය 429658) මහතා ද ලේකම් ලෙස කර්තෘ මණ්ඩල ප්‍රධාන පරිපාලන නිලධාරි සරත් අමරකෝන් (දුරකථන 429201) මහතා ද සම්බන්ධීකරණ ලේකම් ලෙස 'සිළුමිණ' කර්තෘ මණ්ඩලයේ නිහාල් පී. අබේසිංහ ((දුරකථනය 429268) මහතා ද ක්‍රියා කරති.

ලේක්හවුස් ආයතනය මගින් ක්‍රියාත්මක කරන කොස් වගාව ව්‍යාප්ත කිරීමේ හා කොස් ආශ්‍රිත ආහාර නිෂ්පාදන ජනප්‍රිය කරවීමේ ව්‍යාපෘතියේ ආරම්භක සාකච්ඡාව ලේක්හවුස් ආයතනයේ දී පැවැති අවස්ථාවයි මේ.

# වනාන්තර විනාශවීමට හේතු මොනවාද?



දෛනික අවශ්‍යතා සඳහා
ගස්වැල් විනාශ කිරීම



රජය සහ පෞද්ගලික අංශය
ව්‍යාපාරික කටයුතු සඳහා දැව කැපීම.
හොර දැව ජාවාරම



ලැව් ගිනි සහ
කැළෑ ගිනි තැබීම



අම්ල වැසි සහ යුදමය කටයුතු නිසා
ඇතිවන වනාන්තර විනාශය

ප්‍රමාණය සියක් කෝටි 8 ක් වනු ඇතැයි ද, එමෙන්ම ඓන්ද්‍රීය ද්‍රව්‍ය පිළිස්සීමෙන් හා මෝටර් රථවාහන වලින්ද කාබන් ටොන් දශලක්ෂ 0.5 ක් ද, හයිඩ්‍රෝකාබන් ටොන් 100,000 ක නයිට්‍රික්ඔක්සයිඩ් ටොන් 26,000 ක්ද වායුගෝලයට එක්වෙතැයි විද්‍යාඥයන් විසින් ගණන් බලා ඇත. මේ ග්‍රහලොව මත ගමන් කරන වාහන සංඛ්‍යාව පමණක් කෝටි 25 කි.

ගස්වර්ග කිහිපයක පත්‍රවලින් මෝටර් වාහන වලින් පිටකරනු ලබන වායුවල අඩංගුව පවතින "ලෙඩ් මෙට්රා එතිල්" නම් ඊයම් වර්ගය උරා ගනී.

ලංකාවේ මහා මාර්ග දෙපස මෙවැනි ගස් වර්ග වැවීමේ දීප-ව්‍යාප්ත ව්‍යාපාරයක් කඩිනමින් ආරම්භ කළ යුතු ය. හයිලෙවල් සහ ගාලු මහා මාර්ගය දෙපස පිහිටි විශාල ගස් දැවැන්ත දැන්වීම් පුවරු සඳහා ඉවක් බවක් නොමැතිව කපා දැමීන. ආරක්ෂක හේතුමත කිය-මින්ද මග දෙපස ගස් කොළන් විනාශ කර දැමූහ. රජය, පෞද්ගලික අංශයේ ද සහාය ඇතිව පළාත් සභා මට්ටමෙන් ගස් වැවීම කෙරෙහි උත්සුක විය යුතුයි. ලංකාවේ වනාන්තර රැක ගැනීමේ නීතිරීති පනවා ඇතිමුත්, එය යල් පැනගිය නීති පද්ධතියකි. ඉතා භයානක අන්දමින් අද ගස් කපා දැමීම කර-ගෙන යන බව පෙනේ. ගස් ගැන කතාකරනවිට ආතර් වී. දියෙස් මහතා ද මතකයට නැගේ.

"මුත්තෝ වැව්වෝ – මුණුබුරෝ කපනවෝ" යනුවෙන් ප්‍රකාශ කර-මින්, ගස්කොළන් වැවීම කෙරෙහි එතුමෝ ලක්වැසියන් උනන්දු කර-වූහ. අපි කන බොන බොහෝ දේ අන්‍යයකු විසින් සිටුවන ලද ගසක වැලක අතුරු ඵලයක්යැයි සිතන්නේ කීයෙන් කී දෙනෙක් ද?

චීනයේ වන විද්‍යා සංවර්ධනය ඉතා අගය කළ යුතු ය. එහි සතර-වෙනි වෘක්ෂ රෝපණය ඉතා සිත්-ගන්නා ක්‍රමයකි. එනම් මහා මාර්ග, දුම්රිය මාර්ග, ගම්මාන සහ ඇළ දෙළ ගංගා යනාදිය ඔස්සේ නනි පේළි වශයෙන් එක්තරා ක්‍රමයකට සිටුවීමයි. මෙම ක්‍රමයෙන් සුළි සුළඟින් ආරක්ෂාවීම, වගාවනට සුදුසු පරිසරය ලබා ගැනීම යනාදිය සඳහා පහසුකම් සැලසේ.

ලංකාවේ අති විශාලතම සංවර්-ධන යෝජනා ක්‍රමය වශයෙන් හඳුන්වන මහවැලි යෝජනා ක්‍රමය නිසා අක්කර 650,000 කට වඩා එළිපෙහෙළි කර හමාර ය. වර්ෂා-පතනය අඩුවීම, වියළි සුළඟ දිවා රෑ නදින් සුළං හැමීම, පසේ උෂ්ණත්වය වැඩිවීම යනාදී බරපතල පරිසර ප්‍රශ්නවලට මුහුණ පෑමට සිදුවන බව කැනඩා ලංකා සැලසුම් ක්‍රමය යටතේ මහවැලි ගංගා ද්‍රෝණියේ සම්පත් අරභයා කරන ලද පරීක්-ෂණ වලින් පෙන්නුම් කරයි.

වන සංරක්ෂණ නිලධාරීන් විසින් සපයන ලද වාර්තා අනුව 1902 දී සකස් කරන ලද වාර්තාවට අනුව ලංකාවේ මුළු වනගහනය අක්කර 7,249,245 යනුවෙන් සඳහන් වේ. එහෙත් නොයෙකුත් අක්‍රමිකතා මගින් විනාශ කර දමන කැලෑ ප්‍රමා-ණය අද වනතෙක් නිසි ලෙස ගණන් බලා නොමැත. සෑම වර්ෂයකම වන සංරක්ෂණ පනත උල්ලංඝනය කරමින් නීති විරෝධී ක්‍රියා 1000 කට වඩා සිදුවන බව වන සංරක්-ෂණ දෙපාර්තමේන්තුවේ උසස් නිලධාරියකු මා සමග පැවසී ය.

ලංකාවේ සෑම පුරවැසියකු අවම වශයෙන් අවුරුද්දකට එක් ගසක් හෝ රෝපණය කළහොත් එය කෝටි දෙකකට ආසන්න වනු ඇත. දෙකෝටියකට වඩා අමතර ආදය-මක් ද ලැබෙයි.

ගස් ගැන කතාකරනවිට
ආතර් වී. දියෙස් මහතා ද
මතකයට නැගේ.
"මුත්තෝ වැව්වෝ – මුණුබුරෝ
කපනවෝ" යනුවෙන් ප්‍රකාශ කරමින්,
ගස්කොළන් වැවීම කෙරෙහි
එතුමෝ ලක්වැසියන් උනන්දු කරවූහ.

ඒ අනුව පුද්ගලයකුගේ අවම වාර්ෂික ආදයම රු. 35/- කි. ගස හොඳින් හද වඩා ගැනීම පමණි ඔබට ඇත්තේ.


පැරණි ගම්වාසීන් කුරුම්බයක් කඩාගෙන සප්පායම්වීමට ප්‍රථම "මේව හිටෝපු ඇත්තන්ට පිංසිද්ද වෙච්චාවේ" යැයි කටපුරා කියති. එයින් ධ්වනිත වන්නේ ගසක් සිටුවීමේ මහඟු ඵලය යි.

බෞද්ධ සාහිත්‍යයේ ද ගස් කොළන්වලට හිමි වී ඇත්තේ සුවිශේෂ ස්ථානයකි. සංයුක්ත නිකායේ "සද පුඤ්ඤ වඩ්ඪති" සූත්‍රයේ ගස් රෝපණය මහා පුණ්‍ය කර්මයක් හැටියට හැඳින්වේ. මහා වංශය, චූලවංශය සහ පූජාවලියේද ගස් සිටුවීම පිළිබඳ විවිධ කථා, රසවත් සිද්ධීන්ගෙන් ගහන ය. "කොස් වනයක්" බිහිකළ එක්තරා ඇමතියකුට තෑගි වශයෙන් රජතුමාගෙන් ගම්වරයක් ලැබුණු බව චූල වංශයේ 86 වෙනි පරිච්ඡේදයේ ගෙනහැර දක්වයි.

ආචාර්ය ජේම්ස් බොනර් ඇතුළු අමෙරිකානු පරිසරවේදීන් කණ්ඩායමක් අපේ වන සම්පත් පිළිබඳව ඉතා අගනා වාර්තාවක් ඉදිරිපත් කළේ ය. අවුරුදු පතා හෙක්ටයාර් 40,000 - 60,000 කැලෑ ප්‍රමාණයක් අප විනාශ කර දමන බව ඔවුහු පෙන්වා දෙති. මෙම තත්ත්වය යටතේ කැලෑ මැනවින් ආරක්ෂා නොකළහොත් ක්‍රි. ව. 2010 දී ශ්‍රී ලංකාවේ වනාන්තර මුළුමනින්ම විනාශවීමේ අවදානමකට ලක්වී ඇති බව මොනවට පෙන්නුම් කරයි.

වනය "වණයක්" කළ හැකි ය. එහෙත් වනයක් බිහි කිරීම ලෙහෙසි පහසු කාර්යයක් නොවේ. ❑

# දුප්පතාගේ බත් ගස සඳ සුරකිමු



**කොස් වර්ග කිහිපයක් ම දැනටමත් අප රටෙන් තුරන් වීමට ආසන්න වී ඇති අතර මැල්ලුමට පමණක් ගන්නා "කුරුකොස්" වර්ග සොයා ගැනීම "කළුනික සෙවීමට" නොදෙවෙනි ක්‍රියාවකි. ඉන්දියාව, මැලේසියාව සහ පිලිපීනය කොස් ගසින් සිංහලයාට වඩා ප්‍රයෝජන ගන්නා බව පැහැදිලිව කිවයුතුව ඇත.**

"දුප්පතාගේ බත් ගස" යනුවෙන් ආතර් වී. දියෙස් විද්වතානන් හැඳින්වූ දෙවන කප්රුක එසේත් නොමැති නම් කොස්ගස රැක ගැනීම සඳහාත්, එය වඩා හොඳින් ව්‍යාප්ත කිරීම සඳහාත්, දීර්ඝකාලීන වැඩපිළිවෙලක් සකස් කිරීම ජාතික අවශ්‍යතාවක් සපුරාලීමකි. රජයත්, රාජ්‍ය නොවන පරිසර සංවිධානත් ඒකරාශී වී කොස්ගස නගා සිටුවීම පිණිස ගත යුතු පියවර සාකච්ඡා කොට කඩිනම් ක්‍රියාදමයක් දියත් කිරීම අනාගත පරපුර වෙනුවෙන් කරන මහඟු සේවයක් වනු ඇත.

අපේ ගම්බද ජනයා තුන්වේල පිරිමසා ගැනීම පිණිස බතට කොස්ද එකතු කළ බව ගමේ ගොඩේ තොරතුරු දන්නා අයට අරුමයක් නොවේ. කොස් ගසින් ගම්බද පෙදෙස්වල ජනයා ගනු ලබන ඵල ප්‍රයෝජන අපමණ ය. කොස් අවාරයේදී එය ආහාරයට එක් කිරීම පිණිස වාරයේදී වැලිකොස්, සහ අටුකොස් සකස්කර තැබීම පැරණි ගම්බද ගෘහණියන්ගේ සම්ප්‍රදයකි.

ළපටි වියේ පොලොස් ඇඹුල පැහිමාලුව පොලොස් මැල්ලුම කලකදී ගැටකොස්, දඬු කොස්, කළුපොල් මාළුව සහ කිරිකොස් බවට පැමිණෙයි. හොඳට පැසුණු කොස් තම්බා කරවල හොද්දක් හෝ කිරි හොද්දක් හෝ සමග කෑම රජ දවස දක්වා ඇතට විහිදෙන රස කෑමකි.

කොස් වර්ග කිහිපයක් ම දැනටමත් අප රටෙන් තුරන් වීමට ආසන්න වී ඇති අතර මැල්ලුමට පමණක් ගන්නා "කුරුකොස්" වර්ග සොයා ගැනීම "කළුනික සෙවීමට" නොදෙවෙනි ක්‍රියාවකි. ඉන්දියාව, මැලේසියාව සහ පිලිපීනය කොස් ගසින් සිංහලයාට වඩා ප්‍රයෝජන ගන්නා බව පැහැදිලිව කිවයුතුව ඇත.

කොස්ගස පිළිබඳව අපගේ දැනුම ඉතා අල්ප බව අප විසින් කරන ලද සමීක්ෂණයක දී එළිපෙහෙළි වූ කරුණකි. ඖෂධයක් වශයෙන් කොස් ගසින් බොහෝ ඵල ප්‍රයෝජන ඔවුහු ලබාගන්නා අතර එය එදිනෙද ජීවිතයට ශක්තියකි. එනෙක් මෙනෙක් කිසිදු රජයකින් වුවද කොස්ගස පිළිබඳව එතරම් සැලකිල්ලක් නොදැක්වූ බව කණගාටුවෙන් වුවද සඳහන් කළ යුතු ය.

කොස්ගස ගැන විධිමත් පරීක්ෂණයක් කිරීමට කිසිදු රටක් තවම අත නොගැසූ බව පෙනෙන්නට ඇති කරුණකි. කොස් පර්යේෂණාගාරයක අවශ්‍යතාව සඳහන් කරමින් මෙයට දසක කිහිපයකට පෙර ගුණදාස ලියනගේ ශූරීන්ගේ "කල්පනා"වට ප්‍රකාශයක් කළේ ය. එම ලිපිය නෙත ගැටුණු මූලික අධ්‍යයන ආයතනයේ මහාචාර්ය සිරිල් පොන්නම්පෙරුම විද්‍යාඥයා කොස්ගස පිළිබඳව පර්යේෂණ අරඹන්නට අඩිතාලම දැමූ නමුදු අපගේ අභාග්‍යයකට දෝ එය අතර මග නවතා දැමූ බවක් දිස්වෙයි.

අරාබි ජාතිකයන් පැණි වරකා කෑමට දක්වන්නේ බලවත් ආශාවකි. ඇට ඉවත් කරන ලද, පැණිවල බහාලන ලද වරකාවලට ලෝක වෙළෙඳ පොළේ හොඳ ඉල්ලුමක් ඇත. විවිධ දේශාන්තරයන්හි වෙසෙන ශ්‍රී ලාංකිකයන් ද කොස් කෑමට දක්වන්නේ මහත් ගිජුකමකි. ඉන්දියාවේ කේරළ දේශයෙන් නානා මාදිලියේ කොස්කෑම වර්ග ලෝක වෙළෙඳපොලට සේන්දු වී ඇත.

තවමත් කිසිදු රසායන පොහොරකින් තොරව කොස් ගසක් කදිමට වවාගත හැකි ය. කොස් පැළයක් සිටුවා එයට සාත්තු කිරීමෙන් පුදුම මානසික වින්දනයක් ඔබට ලබා ගත හැකි ය. අධික රුධිරපීඩනය ගස් කොළන්වලට සාත්තු කිරීමෙන් පාලනය කර ගත හැකි අතර කොස් පොළොස් මධුමේහයට දිව ඔසුවකි.

සහල් මිල ඉතා ඉහළ නගින අවධියක කොස්ගස් වැවීමේ ව්‍යාපාරයක් ආරම්භ කළහොත් එයින් අත්වන විපුල ඵලප්‍රයෝජන අපමණ ය. සහල් මිල සම තත්ත්වයක පවත්වාගෙන යාමට ද රුකුලක් වනු ඇත. අපේ රටේ ඇතැම් පෙදෙස්වල කොස්වාරයේදී සහල් මිල ඉහළ නොයන බව මා දැක තිබේ.

**වියළි දේශගුණයට ඔරොත්තු දෙන කොස් පැළයක්**

වියළි ප්‍රදේශවල (කොස් වැවෙන පෙදෙස්) දිවි ගෙවන බොහෝ දෙනා කොස් ගසක් හදවඩා ගැනීමට අභිරුචියක් දක්වන අතර ඔවුනට එසේ වවා ගැනීමට නොහැකි වී ඇත්තේ එහි පවතින අධික උෂ්ණ ගතිය නිසා ය. බොහෝ දෙනෙකු විටින් විට මෙම කරුණ පිළිබඳව මගෙන් විමසූ අතර එබඳු ශුෂ්ක දේශගුණයකට මුහුණ දිය හැකි කොස් පැලයක් සිටුවා ගන්නා අන්දම ද කියාපෑම මැනවැයි සිතමි. අඟල් 4 ක් පළල, අඟල් 6 ක් උස ඉවත දමන ලද පොලිතීන් බෑගයක් සොයා ගන්න. එය හොඳින් පස්වලින් පුරවා ගන්න. දැන් හොඳ කොස් බීජයක් ගෙන පොලිතීන් බෑගයේ තවාන් කරන්න. මාස 1 1/2 ක් යනතුරු හොඳින් වතුර දමා සාත්තු කරන්න. පොලිතීන් බෑගයේ අඩියට වෙන්නට කුඩා සිදුරක් කරන්න. ඒ අමතර වතුර බැස යාමට යි.

කොස් පැළය අඟල් 10–12 උසට වැඩුණු පසු පොලිතීන් කවරයේ අඩිය වටේ සිදුරු කර හොඳ තැනක සිටවා ගන්න. කොස් පැළයට අඟල් 6–8 ක් දුරින් වළක් කපා කළයක් ගෙන කට පමණක් උඩට සිටින සේ වළලන්න. කළය වතුරෙන් පුරවා කට යම්කිසි දෙයකින් වසන්න. කොස් පැලය ඉක්මනින් හදවඩා ගැනීමට අවශ්‍ය නම් රසායනික පොහොර දියරක් කළයට එක් කරන්න. කළයේ වතුර අඩුවෙනවිට වරින්වර වතුර පුරවන්න මතක තබා ගන්න. දැන් කොස් පැළයේ මුල් කළගෙඩිය දෙසට ඇදේ. කළගෙඩියේ වතුර පිරී තිබෙන තෙක් දැඩි හිරු රශ්මියට ඔරොත්තුදීමේ හැකියාවක් කොස් පැළයට තිබේ.

**තවත් ක්‍රමයක්**

කොස් පැළයට අධික හිරු රශ්මියක් පතිතවන්නේ නම් ඉපිල් ඉපිල් හෝ වැටමාර සිටවන්න කොස් පැළය වටා. කොස් පැළය හොඳින් වැඩුණ පසු අනෙකුත් ගස් ගලවා දමන්න.

**කොස් ගසක ඵලදාව වැඩි කර ගන්නේ කෙසේ ද?**

ගසකින් බිමට වැටෙන කොළ විසිකර දැමීම හෝ පුච්චා දැමීම සාමාන්‍ය සිරිතකි. ඔබගේ වත්ත ඉඩකඩ ඇත්නම් කොස් ගසේ වැටුණු කොළ ගසේ සිට අඩි 3–5 ක් ඈතට වත්තට වළලා දැමීමෙන් ගසේ ගෙඩි ප්‍රමාණය දෙගුණ තෙගුණ කළ හැකි ය. ❑

**පසුගිය නවයුගය කලාපයේ පළ වූ "වනාන්තරයක මවන සිසිලස" ලිපිය ද මෙම ලේඛකයා ගේ ම නිර්මාණයකි.**